# රැකියා ඇබෑර්තු

## GSMB ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම

### (භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අනුබද්ධ ආයතනයකි)

සමාගමේ පහත සඳහන් මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු පිරවීම සඳහා අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**(1) කැණීම් ඉංජිනේරු**

අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද (පහත 01 හෝ 02 සමග 03)

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් කැණීම් හා ඛනිජ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත විද්‍යාවේදී ප්‍රථම උපාධියක් තිබීම.

(02) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත විද්‍යාවේදී ප්‍රථම උපාධියක් තිබීම

**සේවා පළපුරුද්ද**

(03) ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව, තනතුරට අදාළව කැණීම් ක්ෂේත්‍රයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද අවම වසර එකක් (01) ක් තිබීම.

සමාන සමාගමක/ තිරිවාන කැණීම් සහ සැකසුම් ව්‍යාපෘතියක පළපුරුද්ද හෝ පුහුණුව අමතර සුදුසුකමක් සේ සැලකේ.

**(2) භූ විද්‍යාඥ**

අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව/ පරිගණක විද්‍යාව/ ජීව විද්‍යාව අනුබද්ධ විෂයක් ලෙස වූ භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) ප්‍රථම උපාධියක් තිබීම (පළමු හෝ දෙවන පන්තිය)

**සහ**

**සේවා පළපුරුද්ද**

ප්‍රථම උපාධිය ලැබීමෙන් අනතුරුව, භූ විද්‍යා ක්ෂේත්‍රයෙහි පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද අවම වසර එකක් (01) තිබීම.

**(3) මානව සම්පත් හා පරිපාලන කළමනාකරු**

බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් මානව සම්පත් / කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ වාණිජ්‍ය පිළිබඳ ප්‍රථම උපාධියක් තිබීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව මානව සම්පත්/ පරිපාලන/ කළමනාකරණය ක්ෂේත්‍රයෙහි පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද අවම වසර එකක් (01) තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : (පහත 01 හෝ 02)

(01) ඉහත දක්වා ඇති බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

(02) මානව සම්පත්/ පරිපාලන ක්ෂේත්‍රයේ "කණිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ" - (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**(4) අභ්‍යන්තර විගණක**

බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද (පහත 01 හෝ 02)

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් වාණිජ්‍ය/ ගිණුම්කරණය පිළිබඳ ප්‍රථම උපාධියක් තිබීම. ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළව විගණන ක්ෂේත්‍රයෙහි පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද අවම වසර එකක් (01) තිබීම.

(02) තනතුරට අදාළව විගණන/ ගිණුම්කරණ ක්ෂේත්‍රයෙහි වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත්ව තිබීම.

**සහ**

තනතුරට අදාළව විගණන ක්ෂේත්‍රයෙහි පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද අවම වසර එකක් (01) තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : (පහත 01 හෝ 02)

(01) ඉහත දක්වා ඇති බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් (01 හෝ 02) සපුරා තිබීම.

(02) තනතුරට අදාළව, විගණන ක්ෂේත්‍රයෙහි "කණිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වේතන**

➢ මූලික වැටුප (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව) රු. 71,730/= සහ ජීවන අංක දීමනාව, වෘත්තීය දීමනාව, දුරකථන දීමනාව, ප්‍රවාහන දීමනාව, ව්‍යාපෘති දීමනාව - කැණීම් ඉංජිනේරු සහ භූ විද්‍යාඥ තනතුරු සඳහා හිමි වේ. (රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්ති මත වැටුප් සහ දීමනා සංශෝධනයන්ට යටත් වේ.)

➢ සේවකයින් සහ ඔවුන්ගේ පවුල් ආවරණය වන වෛද්‍ය රක්ෂණය.

➢ සමාගම් සුභසාධන ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබීම.

**වයස සීමාව**

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තනතුරට අදාළ වන පොදු කොන්දේසි**

- කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනේ.
- තෝරාගත් අයදුම්කරුවන්ගේ වැටුපෙන් 8% සේවක අර්ථසාධක අරමුදල සඳහා අයකරන අතර, සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ක් බැර කරනු ලැබේ.
- දැනට රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලහි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.
- අයදුම්කරුගේ සත්‍යපනය ලබාගැනීම සඳහා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ දුරකතන අංක අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.
- අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, වෘත්තීය සුදුසුකම් සහ අදාළ වෙනත් සහතික පත්‍රවල ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

ඔබගේ ජීවදත්ත ඇතුළත් අයදුම්පත් 2025/06/02 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි සඳහන් කළ යුතුය.

**සභාපති,**
**GSMB ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම,**
**අංක 569, එපිටමුල් පාර,**
**පිටකෝට්ටේ.**